කොටගල ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 18 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කොටගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 28 දින පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුණු රු.2,451,249 ක ප්‍රතිපාදන වලට අදාළ මුදල් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් ලැබී නොතිබියදී ප්‍රතිපාදන මුදල් ප්‍රතිපූර්ණය සඳහා අදාළ ලේඛන පිළියෙල කර ගිණුම් තැබීම හේතුවෙන් ගබඩා තොග ගිණුම හා ගබඩා ණය හිමියන් රු.2,451,249 බැගින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | අමාත්‍යාංශය වෙතින් ලබාදුන් භාණ්ඩ මිල ගණන් ඉහළයාම නිසා මිලදී ගැනීමේ ගැටළුවක් පවතින අතර මේ සම්බන්ධයෙන් සභාවේ මුදල් කමිටුවට යොමුකර එම කමිටුවේ නිර්දේශ මත මෙම වර්ෂය තුළ අදාළ භාණ්ඩ මිලදී ගැනීමට නියමිතය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | 2020 දී නිවැරදි කරගැනීමට පියවර ගෙන ඇත. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ හිඟ මුද්දර ගාස්තු 1,781,620 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | 2020 දී නිවැරදි කරගැනීමට පියවර ගෙන ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉදිරි වර්ෂය සඳහා කලින් ලද ආදායම් රු.483,563 ක් වුවද, ශේෂ පත්‍රයේ රු.132,244 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | 2020 දී නිවැරදි කරගැනීමට පියවර ගෙන ඇත. |

1.4 අනුකූල නොවීම්

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

--------------------------------------------------------------------------

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | වාර්තාව සකසා ඉදිරිපත් කළ යුතු වේ. | අදාළ වර්තාව පිළියෙල කරමින් පවතී. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන) රීති 218 | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් කර නොතිබුණි. | අදාළ සමීක්ෂණයන් සිදු කළ යුතු වේ. | සභාවේ දේපළ තක්සේරු කරදෙන ලෙස ඉල්ලීම් කර ඇත. |
| (ඇ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව 2008 වර්ෂයට පසුව සිදුකර නොතිබුණි. | චක්‍ර ලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | මෙම මුදල් කඩිනමින් පියවීමට කටයුතු කරමින් පවතී. |
| (ඈ) | මුදල් රෙගුලාසි අංක 371(2 )(අ) | විවිධ පාර්ශවයන් වෙත අවස්ථා 04 කදී දෙන ලද රු.38,487 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

1.5 බදු අවශතාවයන්ට අනුකූල නොවීම

----------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු බදු පනත අනුව සමාලෝචිත වර්ෂය තුළ අය කරන ලද රු.25,115 ක මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | මුද්දර බදු පනත අනුව කටයුතු කළ යුතු වේ. | දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකයක් ලැබී නොමැති බැවින් ප්‍රේෂණය කිරීමට නොහැකි වී ඇත. |
| (ආ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී | ජාතිය ගොඩනැගීමේ බදු පනත අනුව කටයුතු කළ යුතු වේ. | දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකයක් ලැබී නොමැති බැවින් |

| | | |
|---|---|---|
| අයකළ ජාතිය ගොඩනැගීමේ බදු රු.56,709 ක මුදලක් ප්‍රේෂණය කර නොතිබුණි. | | ප්‍රේෂණය කිරීමට නොහැකි වී ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,779,040 ක් විය. ඊට ප්‍රතිරූපීව පසුගිය වර්ෂයේ පුනරාවර්තන ආදයම ඉක්මවූ වියදම රු.566,329 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,760,000 | 2,248,777 | 2,512,926 | 2,459,076 | 2,911,946 | 1,229,892 | 691,013 | 2,172,510 |
| කුලී | 2,028,800 | 1,781,496 | 1,907,639 | 412,521 | 410,000 | 1,131,225 | 973,149 | 538,664 |
| බලපත්‍ර ගාස්තු | 1,820,600 | 1,461,710 | 1,461,710 | - | 2,228,000 | 650,800 | 656,800 | - |
| වෙනත් ආදායම් | 1,070,000 | 5,966,100 | 6,288,875 | 1,446,874 | 889,961 | - | 181,073 | - |
| | 6,679,400 | 11,458,083 | 12,171,150 | 4,318,471 | 6,439,907 | 3,011,917 | 2,502,035 | 2,711,174 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ 2016 මාර්තු 17 දිනැති අංක මප/ප.පා.කො/2016/03 දරන චක්‍රලේඛය ප්‍රකාරව කඩ කාමර තක්සේරු කර නොතිබුණු | අදාළ තක්සේරුව සිදුකර ඒ අනුව කටයුතු කළ යුතු වේ. | මෙම කඩ කාමර තක්සේරු කිරීමට පිඹුරුපත් නොමැති බැවින්, පිඹුරුපත් සකස් කර තක්සේරු දෙපාර්තමේන්තුවට |

| | | | |
|---|---|---|---|
| | අතර, එකී කුලිය යටත් පිරිසෙයින් වසර 05 කට වරක්වත් සංශෝධනය නොකර 2014 වර්ෂයේදී නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ ආදායම් පරීක්ෂකවරයෙකු විසින් තක්සේරු කරන ලද කුලී අය කෙරෙමින් පැවතුණි. | | ඉදිරිපත් කර තක්සේරු කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව සතු කඩ කාමර 60 ක් සඳහා රු.400 සිට 750 දක්වා මාසික කුලී අයකරමින් පැවති අතර මුළු මාසික බිල්කිරීම රු.41,500 ක් පමණක් විය. | අදාළ තක්සේරු කඩ කුලී අය කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම කඩ කාමර තක්සේරු කිරීමට පිඹුරුපත් නොමැති බැවින්, පිඹුරුපත් සකස් කර තක්සේරු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තක්සේරු කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සභාව සතු ලොක්හිල් ප්‍රදේශයේ පවතින ඉඩම් කැබලි 09 ක බදුකරුවන්ගෙන් මාස 43 සිට මාස 126 දක්වා කාල පරාසයකට අදාළව පැවති හිඟ කුලී අයකරගෙන නොතිබුණි. | හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ස්ථානය පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර ඇත. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසාවි දඩ රු.1,446,874 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ මුදල් ගෙන්වා ගැනිමට කටයුතු කළ යුතු වේ. | පළාත් සභාවෙන් නිදහස්කර ගැනීමේ ප්‍රමාදයක් පවතින අතර මුදල් නිදහස් කර ගැනීමට ඉල්ලීම් කර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) පරිසර බලපත්‍ර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ බලපවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව නිකුත් කර ඇති 2008 ජනවාරි 25 දිනැති අංක 1523 /16 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව | අවශ්‍ය පරීක්ෂණ සිදුකර ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කළ යුතු වේ. | වලංගු කාලය අවසන් වූ පරිසර බලපත්‍ර පිළිබඳව සමීක්ෂණයක් සිදුකර කාලය දීර්ඝ කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. |

පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන වලංගු කාලය අවසන්වී තිබූ ව්‍යාපාර 03 කට නව බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අතහැර දැමූ කර්තව්‍යයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 මැයි 11 දින රු.83,373,432 ක වියදමින් සභාව නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළඹ තිබුණ අතර, 2016 දෙසැම්බර් 31 දින වන විට ඒ සඳහා රු.21,559,211 ක් ගෙවා තිබුණි. පරිපාලන හා තාක්ෂණික ගැටළු හේතුවෙන් එහි වැඩ වසර 02 කට අධික කාලයක සිට නතර කර දමා තිබුණි. | අදාළ පාර්ශවයන් සමඟ එකඟතාවයන්ට පැමිණ ව්‍යාපෘතිය නිම කරවා ගැනිමට කටයුතු කළ යුතු වේ. | උක්ත ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ලබා ගැනීමට උත්සහ දරමින් පැවතිය ද පවතින නීතිමය තත්ත්වය හේතුවෙන් එම කාර්යය ප්‍රමාද වෙමින් පවතී. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත්වී නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී ඒ සම්බන්ධයෙන් නිශ්චිත කාර්යයන් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒ අනුව සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයට තිරසර සංවර්ධන ඉලක්ක සැලසුම් කර නොමැති අතර ඉදිරියේදී ඒ සඳහා අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගෙන ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදි අනතුරට පත්වී තිබුණු සභාව සතු ලොරි රථය සම්බන්ධව මුදල් රෙගුලාසි 104 ප්‍රකාර පරික්ෂණය පවත්වා නොතිබුණු අතර අදාළ රක්ෂණ ආයතනයෙන් කිසිඳු වන්දි මුදලක්ද ලබාගෙන නෙතිබුණි. | අදාළ පරික්ෂණය ඉක්මනින් නිමකර අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනිමට කටයුතු කළ යුතු වේ. | රක්ෂණ වන්දි ගෙවීම රක්ෂණ සංස්ථාවෙන් ප්‍රතික්ෂේප කර ඇත. මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාර පරික්ෂණයක් පැවැත්වීම සඳහා යොමුකර ඇතත් මෙතෙක් පරික්ෂණ පවත්වා නොමැත. |
| (ආ) | කොටගල ප්‍රාදේශිය සභාව සංස්ථාපනය කර වසර 02 කට ආසන්න කාලයක් ගතවී ඇතත් පැවති නුවරඑළිය ප්‍රාදේශිය සභාව විසින් පවරා දෙන ලද ඉඩම් සහ | නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉඩම සහ ගොඩනැගිලිවල නීත්‍යානුකූල හිමිකම ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | ගොඩනැගිලි ඒකක 17 ක නීත්‍යානුකූල හිමිකම පවරාගෙන නොතිබුණි. | | |
| (ඇ) | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින්ගෙන් ඇප තැන්පත් ලබාගෙන නොතිබුණි. | අදාළ වගකීම් ඉටු කරන ලද නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | සේවක ඇප මුදල් ජූනි මාසයේ සිට අය කර ගැනීමට කටයුතු කර ඇත. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තනතුරු 14 ක පුරප්පාඩු 44 ක් පැවතුනි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | සභාගත තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අදාළ මූලික කටයුතු සිදු කර ඇත. අවසන් වූ විගස බඳවා ගැනීමට නියමිතය. සෙසු තනතුරු සඳහා නිළධාරීන් ලබාදෙන මෙන් ඉල්ලීම් කර ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශිය සභාවට අයත් භාවිතයෙන් ඉවත් කරන ලද කුඩා කුබෝටා වර්ගයේ ට්‍රැක්ටර් රථයක් සහ ටේලර් රථ 04 ක් අපහරණය නොකර ප්‍රාදේශිය සභා පරිශ්‍රයේ රඳවා තිබුණි. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව කටයුතු කළ යුතු වේ. | මෙම වත්කම් සභාව සතු නොවන අතර නුවරඑළිය ප්‍රාදේශීය සභාවට අයත් වත්කම් වේ. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
---------------------------------------

4.1 අයවැය පාලනය
-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 අනුව අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සිදුවී තිබෙන වෙනස්වීම් පිළිබඳව ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව වෙනස්වීම් පිළිබඳව කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කර ඉදිරි වර්ෂයේ අයවැය නිවැරදිව සකස් කිරීමට පියවර ගෙන ඇත. |

4.2 අභ්‍යන්තර විගණනය
-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා ඉදිරිපත් කළ යුතු වේ. | ඉදිරියේදී ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු යොදා ඇත. |